**සබරගමුව පළාත් සභාව - 2017**

**-----------------------------------**

සබරගමුව පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**02.** **මූල්‍ය ප්‍රකාශන**

---

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1** **පළාත් සභා අරමුදල**

---

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

**2.2.2** **අනෙකුත් ගිණුම්**

---

සමාලෝචිත වර්ෂයට අදාළව 2018 ජුලි 16 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 27 | 27 |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 |
| (iii) | පළාත් රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 24 | 24 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 09 | 09 |
| (v) | අරමුදල් ගිණුම් | 02 | 02 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 05 |
| (vii) | මන්ත්‍රී අත්තිකාරම් ගිණුම් | 02 | 02 |
| | එකතුව | 70 | 70 |

**2.2.3** **ගිණුම්කරණ අඩුපාඩු**

---

සමාලෝචිත වර්ෂය තුල පළාත් සභා අරමුදල් වලින් ජනිත වූ රු. 2,319,486,301 ක වත්කම් සහ ඉකුත් වර්ෂවල වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

**2.2.4** **නොසැසඳු පාලන ගිණුම්**

---

එක් ගිණුම් විෂයකට අදාළ පාලන ගිණුම අනුව ශේෂය රු. 12,657,255 ක් වුවත්, උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 12,905,550 ක් වූයෙන් රු. 248,295 ක නොසැසඳීමක් විය.

**2.2.5. අවිනිශ්චිත ගිණුම්**

**---------------------**

2017 දෙසැම්බර් 31 දිනට එක් දෙපාර්තමේන්තුවකට අදාළව පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි එකතුව රු. 10,044,595 ක හඳුනා නොගත් ශේෂයක් පැවතුණි.

**2.2.6 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**------------------------------------**

වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු ගිණුම් ශේෂ වල එකතු වටිනාකම රු. 37,885,837 ක් වූ අතර, ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 25,362,579 ක් විය.

**2.2.7 පිළිතුරු නොලත් විගණන විමසුම්**

**-------------------------------------**

2017 දෙසැම්බර් 31 දින වනවිට නිකුත් කරන ලද විගණන විමසුම් 04 කට 2018 ජුලි 16 දින වනවිටත් පිළිතුරු ඉදිරිපත්කර නොතිබූ අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 158,986,756 ක් විය.

**2.2.8 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------------- | ------------------- |
| **(අ)** | **පනත්** | |
| (i) | නගර සහා ආඥා පනතේ (255 අධිකාරය) 183 (5) උප වගන්තිය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8) හා (9) උප වගන්ති | අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත එකී තැනැත්තා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාළ මුදල ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා නොමැති නම් හා අභියාචනයක් කර නොමැති නම් අදාළ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීම් කර අදාළ මුදල් අයකර ගැනීමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කළ යුතු වුවත්, එසේ කටයුතු නොකිරීම හේතුවෙන් විගණකාධිපති විසින් නිකුත් කළ අධිභාර සහතික වලින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අධිභාර සහතික 05ක් යටතේ එකතුව රු.1,707,457 ක් අයවීමට තිබුණි. |
| (ii) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20(1) වගන්තිය | වලංගු බදු ඉන්වොයිසි ලබා නොගෙන රු. 233,234 ක එකතු කල අගය මත බදු ගෙවා තිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| | xix පරිච්ඡේදයේ 5.6 ඡේදය | ඇඹිලිපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ නිල නිවස හා එම කාර්යාලයට අයත් ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන 09ක 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා |

කාලපරිච්ඡේදය තුළ පදිංචි නිලධාරින්ගෙන් නිවාස කුලි අය කර නොතිබීම හේතුවෙන් එකතුව රු.1,894,650 ක ආදායමක් අහිමි වී තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාවේ මුල්‍ය රීති සංග්‍රහය**

මුල්‍ය රීති 422.2 — ආයතන 02 ක් විසින් ඡායා පිටපත් යන්ත්‍ර සැපයීම සඳහා ලියාපදිංචි නොවූ ආයතනයකින් රු. 800,200 ක් වූ යන්ත්‍ර 06 ක් මිලදී ගෙන තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

මු.රෙ. 571 — අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 4 ක එකතුව රු.86,356,106 ක් වූ ඉකුත් තැන්පත් ශේෂ 130 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**(ඉ ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

(i) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන චක්‍රලේඛය

- 3.1 ඡේදය — ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට කටයුතු නොකර බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය විසින් එකතුව රු.608,276,912 ක් වූ කොන්ත්‍රාත් 379 ක් ප්‍රජාපාදක සංවිධාන වෙත පවරා තිබුණි.
- 3.2. ඡේදය — ප්‍රජාපාදක සංවිධානයක් ලෙස හඳුනාගත නොහැකි සුබසාධක සංගමයක් වෙත බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය විසින් එකතුව රු.12,915,000 ක් වූ කොන්ත්‍රාත් 08 ක් පිරිනමා තිබුණි.
- 3.4 ඡේදය — ප්‍රජාපාදක සංවිධානය වෙත පවරනු ලබන කොන්ත්‍රාත්තුව ප්‍රජාපාදක සංවිධානයේ /සමිතියේ බල ප්‍රදේශය තුළ විය යුතු වුවත්, ඊට පටහැනිව බල ප්‍රදේශයෙන් පරිබාහිර ප්‍රජාපාදක සංවිධාන වලට ආයතන 02 ක් විසින් අවස්ථා 41 කදී එකතුව රු.73,604,535ක් වූ කොන්ත්‍රාත් පවරා තිබුණි.

(ii) 2016 පෙබරවාරි 16 දිනැති අංක 431(1) දරන චක්‍රලේඛය — ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෑගල්ල දිස්ත්‍රික් කබඩි කණ්ඩායමේ ඉරාන සංචාරය සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි වී නොතිබුණු ආයතන වලින් මිල ගණන් කැඳවා රු.1,936,000 ක ගුවන් ටිකට්පත් මිල දී ගෙන තිබුණි.

| | | |
|---|---|---|
| (iii) | 2015 මැයි 15 දිනැති අංක මු.අ.01/2015/01 දරන චක්‍රලේඛය | ආරාධිත ආයතනය විසින් සපයන පහසුකම් තහවුරු කර නොගෙන ප්‍රධාන අමාත්‍යවරයා හා පුද්ගලික ලේකම්වරිය සහභාගි වූ විදේශ සංචාර 05 ක් සඳහා සංයුක්ත දීමනා හා සංග්‍රහ දීමනා ලෙස රු.2,702,447ක් ගෙවීම් කර තිබුණි. |
| **(ඊ)** | **පළාත් සභා සහ පළාත් පාලන චක්‍රලේඛ** | |
| | 2001 මාර්තු 28 දිනැති අංක මුදල් 01/2001 චක්‍රලේඛයේ 6 ඡේදය | මන්ත්‍රීධුරයෙන් පහ කිරීම, මිය යෑම හෝ හදිසියේ විසුරුවා හැරීම වැනි අවස්ථාවන්හිදී ගෙවිය යුතු සියළුම ණය මුදල් එකවර සම්පූර්ණයෙන් අයකර ගැනීමට කටයුතු කලයුතු වුවත්, ධුරය අහෝසි වී තිබූ මන්ත්‍රීවරයෙකුට අදාළව රු. 208,040 ක ණය ශේෂය 2015 සැප්තැම්බර් 27 දින සිට හිඟව පැවතුණි. |
| **(උ)** | **වෙනත් චක්‍රලේඛ** | |
| (i) | 2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොතේ 14.3.1 හා 15.2 උප වගන්ති | නිවිතිගල හා ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාල වලට අයත් පාසල් 274 කින් පාසල් 110 ක් නියමිත පරිදි සිව්මස් ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 2006 මාර්තු 18 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ සහ 2006 ඔක්තෝබර් 23 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිය | ප්‍රධාන අමාත්‍යවරයාට නිල වාහන දෙකක් සහ එක් ආරක්ෂක රථයක් පමණක් වෙන් කළ යුතු වුවත්, එම විධි විධානවලට පටහැනිව නිල වාහන 09 ක් හා ආරක්ෂක රථ තුනක් ඔහු විසින් භාවිතා කර තිබුණි. එසේ භාවිතා කර තිබූ අමතර වාහන 05 ක අළුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් 2015 ජනවාරි සිට 2017 සැප්තැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව එකතුව රු. 5,103,493 ක් වැයකර තිබුණි. |
| **(ඌ)** | **2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| | 1.2 (අ) සහ (ඇ) මාර්ගෝපදේශය | පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ඉටුකරන ලද තනි කර්මාන්ත ලෙස ඉටුකිරීමේ හැකියාව පැවති වැඩ වටිනාකම රු.17,732,885 ක් වූ කර්මාන්ත 05 ක් කොටස් කර කර්මාන්ත 10 ක් ලෙස ක්‍රියාත්මක කර තිබුණි. |
| **(එ)** | **2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය** | |
| | 44(1) වගන්තිය | සෑම ලියාපදිංචි කරනු ලැබූ සමිතියකම ගණන් රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක් මාර්ගයෙන් ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු ලවා හෝ විගණනය කරවිය යුතු වුවත්, රත්නපුර දිස්ත්‍රික්කයට අදාල සමුපකාර සමිති හා අනිකුත් සමිති 35 ක 2014, 2015 හා 2016 |

වර්ෂවලට අදාල ගිණුම් විගණනය කිරීමේ ප්‍රමාදයක් පැවැතුණි.

**03. ආදායම් කළමනාකරණය**

**-----------------------------**

**ඉකුත් වර්ෂ 05 ක ආදායමේ උපනතිය**

**-------------------------------------------**

ඉකුත් වර්ෂ 5 තුළ දී සභාව විසින් එකතු කරන ලද බදු ආදායම සහ බදු නොවන ආදායම පහත පරිදි වේ.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම |
|---|---|---|
| | රු. | රු. |
| 2012 | 2,007,749,583 | 496,404,402 |
| 2013 | 2,163,127,948 | 496,200,284 |
| 2014 | 2,394,497,366 | 676,362,034 |
| 2015 | 2,832,257,548 | 725,367,341 |
| 2016 | 3,214,934,104 | 875,031,415 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සබරගමුව පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 41.1.4 රීතිය ප්‍රකාරව හැකිතාක් නිවැරදි ලෙස තම ඇස්තමේන්තු පිළියෙළ කිරීමට ආදායම් ගණන් දීමේ නිලධාරීන් කටයුතු කළ යුතු වුවද, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කර තිබූ ඉඩම් බදු ආදායම හා 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති ආදායමේ එකතුව 2017 වර්ෂයේ තත්‍ය ආදායම සමඟ සැසඳීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 කට අදාලව සියයට 22 සිට සියයට 651 දක්වා විචලනයන් පැවැතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් අයකර ගෙන නොතිබූ ඉඩම් බදු ආදායම් එකතුව රු. 22,421,561 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දි ඉකුත් වර්ෂයේ තත්‍ය ආදායම් පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් ආදායම් සංකේත 09 කට අදාලව රු.445,487,389 කින් ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා තිබුණි.

**04. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**4.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 1,110,094,728 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,816,974,306 ක් විය.

**4.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

---

පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 17 කට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පනවා තිබූ නෛතික සිද්ධි 132 ක් සහ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 02 ක් විසින් බාහිර පාර්ශවයන් වෙත පනවා තිබූ නෛතික සිද්ධි 97 ක් 2017 දෙසැම්බර් වනවිටත් විභාග වෙමින් පැවැතුණි.

**05. අධිකාරි ගිණුම්**

---

**5.1 කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මූල්‍ය රීති 560 හා 561 පරිදි එකතුව රු. 34,988,580 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ආ) සබරගමුව පළාත් සභාවේ 1990 අංක 04 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය හා 2017 අංක 14 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරිය නව ප්‍රඥප්තියේ 14 වැනි වගන්තියේ සඳහන් කාර්යයන් කිසිවක් අධිකාරිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ඉටු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි .

(ඇ) වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා කාල සීමාවක සිට පැවත එන ණයගැතියන් 35 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 3,360,387 ක් අයකර නොතිබුණි.

(ඈ) ගොඩනැගිල්ල කුලියට දීමෙන් ලද රු. 577,500 ක් හැර ආදායම් උපදවන වෙනත් කිසිදු ක්‍රියාකාරකමක් වෙරළුප අත්කම් මැදුර විසින් 2017 වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

(ඉ) බලවින්න පෙරනිමි කොන්ක්‍රීට් අංගනය මඟින් 2017 වර්ෂය තුළ සිදුකළ නිෂ්පාදන වෙනුවෙන් ගල්, වැලි, සිමෙන්ති හා කම්බි ලෙස යොදාගත් සත්‍ය යෙදවුම්, ඒවායේ ප්‍රමිත යෙදවුම් සමඟ සැසඳීමේදී ප්‍රමිතියට අනුව නිෂ්පාදනය සඳහා යොදාගත යුතු යෙදවුම්, ඒ අයුරින්ම යොදා ගෙන නොතිබුණි. එනම්, 2017 වර්ෂයේ නිෂ්පාදන වලට අදාළව සිමෙන්ති කි .ග්‍රෑම් 16,365 ක්ද, වැලි ඝන අඩි 329 ක්ද, 3/4 ගල් ඝන අඩි 1,237 ක්ද, මි.මී. 6, 10 හා 12 කම්බි කිලෝග්‍රෑම් 2,851 ක්ද අඩුවෙන් යොදා තිබුණි.

(ඊ) 2017 අංක 19 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ 13 (ඇ) වගන්තිය මඟින් අධිකාරියේ කාර්ය මණ්ඩලයට ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ නොවන බවට නීති පනවා තිබුණි. එහෙත් 13(ඉ) වගන්තිය අනුව කාර්ය මණ්ඩලය වෙනුවෙන් කාර්ය පටිපාටික රීති කිසිවක් අධිකාරිය විසින් නිශ්චය කර නොතිබුණි.

(උ) භාණ්ඩ වර්ග 07 ක විකුණුම් මිල, ඒවායේ නිෂ්පාදන පිරිවැයට වඩා අඩු වීම නිසා රු. 19,000 ක අලාභයක් සිදු වී තිබුණු අතර, අධිකාරිය විසින් පිරිවැයට සියයට 25 ක ලාභයක් එකතු කිරීමේ නව ලාභ ප්‍රතිපත්තිය මත මෙම භාණ්ඩ වර්ග 07 වෙනුවෙන් අහිමි වූ ලාභය රු. 297,751 ක් විය.

(ඌ) කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවා වසර 27 ක් ඉක්ම ගොස් තිබුණද, අනුමත කාර්යය මණ්ඩලයක් හා වැටුප් ක්‍රමයක් ස්ථාපනය කරගෙන නොතිබුණි.

## 5.2 සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය

-----------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන පරිච්ඡේදයේ (1) හා (2) වගන්ති අනුව සේවකයාගේ මාසික මුළු ඉපයීම් මත දායක මුදල් ගෙවිය යුතු වුවත් මූලික වැටුප මත දායක මුදල් ගෙවා තිබීමෙන් 2016 වර්ෂය සඳහා රු.2,430,190 ක් අඩුවෙන් ගෙවා තිබුණි.

(ii) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16 වන පරිච්ඡේදයේ (1) වන වගන්තිය ප්‍රකාරව සේවකයාගේ මාසික මුළු ඉපයීම් මත දායක මුදල් ගෙවිය යුතු වුවත් මූලික වැටුප මත දායක මුදල් ගෙවා තිබීමෙන් අධිකාරියේ දායකය 2016 වර්ෂය සඳහා රු. 603,351 ක් අඩුවෙන් ගෙවා තිබුණි.

(ආ) නිල නිවාසයක පදිංචිව සිට මියගිය නිලධාරියෙකුගේ බිරිඳ විසින් පවරන ලද නඩුවක තීන්දුව ප්‍රකාරව, මියගිය ස්වාමි පුරුෂයා වෙනුවෙන් ඇයට හිමි විය යුතු සියළුම ගෙවීම් සිදුකර එම නිවාසය අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම නිල නිවාසය පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන් නිවාසයට ප්‍රවේශ වන මාර්ගයෙහි කොටසක් ද භාවිතා කර අසල්වැසියකු විසින් ගොඩනැඟිල්ලක් ඉදි කර තිබුණි.

## 5.3 සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.

-----------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශය ප්‍රකාරව පිළිගතහැකි සුරක්ෂණයක් මත කොන්ත්‍රාත් මුදලකින් සියයට 20 ක උපරිමයක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව අවස්ථා 02 ක දී සුරක්ෂණයක් ලබා නොගෙන සියයට 40 ක් හා සියයට 55 ක් බැගින් එකතුව රු. 331,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

(ආ) අතිරික්ත මුදල් ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර තිබිය දී දෛනික මූල්‍ය අවශ්‍යතා සඳහා එම තැන්පත් ඇපයට තබා රු. 14,445,000 ක ණය ලබාගෙන තිබූ අතර, තැන්පත් සඳහා ලැබෙන පොලියට වඩා වැඩි ප්‍රතිශතයක් ණය සඳහා ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) අවස්ථා 07 ක දී එකතුව රු. 168,475 ක් වූ වැඩ සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව හා වැඩ නිමකර ඇති බවට කාර්මික නිලධාරි නිර්දේශයකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ඈ) පළාත් සභාව විසින් රු. 7,842,100 ක් වැයකර අධිකාරියට ලබා දී තිබුණු කඩ කාමරවල අයිතිය පවරා ගෙන නොතිබුණි.

(ඉ) අධිකාරියේ ප්‍රධාන අරමුණු වලින් බැහැර කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 1,166,550ක් වැයකර තිබුණි.

(ඊ) පළාත් සභාව මගින් 2015 වර්ෂයේ දී ගන්නා ලද තීරණයකට අනුව මාධ්‍යවේදීන්ට නිදහස් ප්‍රවාහන බලපත්‍ර ලබාදීම සඳහා හැඳුනුම්පත් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේ දී රු. 54,055 ක් වැයකර තිබූ නමුත්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබූ අතර, කමිටු අනුමැතියක් ද නොතිබුණි. ඊට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂාවේදී ව්‍යාජ ලිපිලේඛන පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණ වූ අතර, ඉකුත් වර්ෂයේ ගෙවීම් සඳහා මු.රෙ.115 යටතේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(උ) 2016 නොවැම්බර් 02 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් එකම වියදම දෙවතාවක් යෝජනා කර තිබුණ අතර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකර රු. 286,290 ක වාහන කුලි වියදම් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඌ) 2016 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු වාහනයක් අපහරණය කිරීමට කටයුතු නොකර පෞද්ගලික ගරාජයක ගාල් කර තිබුණි.

(එ) අධිකාරියට අයත් කෑගල්ල බස් නැවතුම්පලෙහි කඩ කාමර 30 ක් සඳහා 2010 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු කඩ කාමර කුලිය තක්සේරු කර අයකර ගෙන නොතිබුණි.

## 06. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 6.1. කාර්යය සාධනය

\- -------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නිවිතිගල කලාපයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා වැඩමුළු පැවැත්වීම වෙනුවෙන් 2013- 2016 දක්වා වූ කාල සීමාව තුළ පිළිවෙලින් රු. 2,212,177 ක් හා රු. 1,756,325 ක් වැයකර තිබුණ ද, එම කාල පරිච්ඡේදය තුළ ඉංග්‍රීසි සමත් ප්‍රතිශතය සියයට 27-29 අතර පරාසයක හා ගණිතය සමත් ප්‍රතිශතය සියයට 50-55 අතර පරාසයක විය.

(ආ) දැනුම පදනම් කරගත් පාසැල් අධ්‍යාපන පද්ධතියක් සකස් කිරීමේ මූලික ව්‍යාපෘතිය (TSEP) සඳහා බලංගොඩ අධ්‍යාපන කලාපය වෙනුවෙන් සකස් කළ 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව එකතුව රු. 16,682,000 ක් වූ වැඩසටහන් 230 ක් සැලසුම් කර තිබුණ ද , 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව එකතුව රු. 8,805,443 ක් වූ වැඩසටහන් 116 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීම වෙනුවෙන් සැලසුම් කර තිබුණු වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම, 2014-2018 සැලැසුමට අනුව ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම එක් අරමුණක් වුවද ,වර්ෂ 2014 සිට 2017 දක්වා කාලසීමාව තුළ ලකුණු 100 ට ලඟාවීමේ ප්‍රගතිය සියයට 70 සිට සියයට 58 දක්වා අනුක්‍රමයෙන් අඩු වී තිබුණි .

### 6.2 තිරසර සංවර්ධනය

--------------------

පළාත් සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ලෙස, තිරසර සංවර්ධනය කරා ගමන් කිරීමේදී ලඟා කරගත යුතු අරමුණු කිහිපයකට අදාල ඉලක්ක 05 ක් හඳුනාගෙන තිබුණි. අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ඒ හා සම්බන්ධ වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ලඟාවිය යුතු සංධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකද ප්‍රමාණවත් පරිදි හඳුනාගත නොහැකි වී තිබුණි. ඒ අනුව, තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය.

**6.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශ 02 ක , දෙපාර්තමේන්තු 04 ක හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින පාසල් 86 ක සිදුවී තිබුණු එකතුව රු.9,192,673 ක් වූ හානි පාඩු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 54 හා 55 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) අඩු ආදායම්ලාභීන්ට නිවාස ආධාර සඳහා 2017 වර්ෂයේ දී රු. 24,983,650 ක් හා කර්මාන්ත ආධාර සඳහා 2016 වර්ෂයේ දී රු. 3,016,797 ක් වැයකර තිබුණ ද, එම සියලු ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් සීමා වී තිබුණි.

(ඇ) 2007 දෙසැම්බර් 13 දිනැති අංක 20/2007 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයට පටහැනිව කලාප 04 ක ගුරුවරුන් 2,360 දෙනෙකු වර්ෂ 08 කට වැඩියෙන් එකම පාසැලක සේවය කරමින් සිටින අතර ඒ තුළ වසර 20 ට වැඩි සේවා කාලයක් සහිත ගුරුවරුන් 338 දෙනෙකු විය. එවැනි ගුරුවරුන් පිළිබඳ තොරතුරු බලංගොඩ, රත්නපුර හා මාවනැල්ල කලාප කාර්යාල වලින් නිශ්චිතව ලබා දී නොතිබුණි.

(ඈ) පළාත් ඉඩම් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පුහුණු හා ධාරිතා සංවර්ධනයට වෙන්කරන ලද රු.22,492,500 ක ප්‍රතිපාදන එකී අරමුණ උදෙසා වැය කිරීමකින් තොරව කෘෂි අලෙවි කුටි 750 ක් මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. ඒ යටතේ මිලදීගෙන තිබුණු හා 2017 නොවැම්බර් 23 දින වනවිටත් බෙදාහැර නොතිබුණු එකතුව රු. 1,229,590 ක් වූ කෘෂි අලෙවි කුටි 41 ක් භෞතික පරීක්ෂාවට ඉදිරිපත් නොකෙරුණි. ප්‍රතිලාභීන් තෝරාගැනීම විනිවිදභාවයකින් යුක්තව සිදුකර නොතිබීම හේතුවෙන් සැබෑ අවශ්‍යතාව සහිත පුද්ගලයින් වෙත සාධාරණ පදනමකින් බෙදාහැරීම් සිදු වූයේද යන්න තහවුරු නොවුණි.

(ඉ) සුන්දර සබරගමුව පොත (ඉංග්‍රීසි) පරිවර්තනය කර මුද්‍රණය සඳහා පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය තුලදී රු. 777,000 ක ප්‍රතිපාදන වෙන්කර 2016 අප්‍රේල් 07 දිනැතිව මුද්‍රණ ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණද 2018 ජනවාරි 16 දින වනවිටත් මුද්‍රණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඊ) පළාත් මාර්ග අමාත්‍යාංශයේ 2016 සහ 2017 වර්ෂවල මාර්ග ඉදිකිරීම්, නඩත්තු කිරීම් සහ ක්‍රීඩා පිටි සංවර්ධනය සඳහා වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 70 ක් ඉක්මවා රත්නපුර දිස්ත්‍රික්කයට වෙන්කරදී තිබුණු අතර, කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිපාදන අවම මට්ටමක පැවතිණි. එසේම රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා දිස්ත්‍රික් ප්‍රතිපාදනයෙන් සියයට 50 ට ආසන්නව හා කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා දිස්ත්‍රික් ප්‍රතිපාදනයෙන් සියයට 40 කට ආසන්නව ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙලෙස වාර්ෂික ප්‍රතිපාදන විෂමතාවකින් යුක්තව වෙන්කර තිබීමෙන් සබරගමුව පළාත තුලිත සංවර්ධනයෙන් බැහැරවීමට හේතුවිය හැකි බව නිරීක්ෂණය විය.

(උ) පළාත් ආයුර්වේද කොමසාරිස් දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ ඔසු උයනක් ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේ දී රු.225,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, විධිමත් වැඩසටහනකට අනුව හා මනා අධීක්ෂණයක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2018 පෙබරවාරි වනවිටත් අරමුණු කරා ලඟා වීමට නොහැකි වී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ වියට්නාමයේ කළ සංචාරයක් වෙනුවෙන් ලබාගත් දීමනා දෝෂසහගත බව පිළිගත් නිලධාරීන් 12 දෙනෙකු විසින් ඔවුන් ලබාගත් රු. 4,191,875 ක්

ආපසු ගෙවා තිබුණද , ප්‍රධාන අමාත්‍යවරයා, එම පෞද්ගලික ලේකම් හා නිලධාරීන් 02 දෙනෙකුගෙන් එකතුව රු.976,000 ක් තවදුරටත් අයවීමට තිබුණි.

(එ) 2017 අගෝස්තු 24 දිනැති අංක 09/2007(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (i) හා (ii) ඡේද ප්‍රකාරව අනුප්‍රාප්තිකයෙකු පත්කිරීමට අපහසු වුවද , වැඩ බැලීම වැනි විකල්ප, ක්‍රිය මාර්ග මගින් දැනට සේවයේ සිටින නිලධාරීන්ගෙන් ඉටු කරගත නොහැකි වූ ද අත්‍යවශ්‍ය තනතුරුවලට පමණක් අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශය මත වයස අවුරුදු 60 ඉක්ම වූ විශ්‍රාමික නිලධාරියෙකු මාස 12 ක උපරිමයකට යටත්ව නිසි බලධාරියාට පත් කළ හැකි ය. එසේම එහි (v) ඡේදය ප්‍රකාරව එම කාල සීමාව තුළ දී ආයතන ප්‍රධානියා විසින් සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනා ගනු ලැබිය යුතු නමුත් යථෝක්ත විධිවිධාන වලට පටහැනිව සබරගමුව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ තනතුර සඳහා වයස අවුරුදු 60 ඉක්ම වූ විශ්‍රාමික නිලධාරියකු පත් කර අවස්ථා හතරක දී පත්කිරීම් කාලය වසර 4 ½ ක් දක්වා බලාත්මක කර තිබුණි.

## 6.4 කසළ කළමනාකරණය

--------------------------

2016 ජූලි 27 දින පැවති සබරගමුව පළාත් විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන පිළිබඳ රැස්වීම් වාර්තාවට අනුව නොදිරන කසල ගබඩා කිරීමට පහසුකම් නොමැති පළාත් පාලන ආයතනවලට ගබඩා පහසුකම් ලබාදීම සඳහා ගොඩනැගිලි ඉදිකර දීමට තීරණය කර තිබුණ ද, තෝරාගත් පළාත් පාලන ආයතන අතුරින් ආයතන 12 ක් සඳහා 2018 මාර්තු 30 දින වනවිටත් ස්ථිර ගොඩනැගිලි ඉදිකර නොතිබුණි.

## 6.5 ඖෂධ කළමනාකරණය

--------------------------

රෝහල් දෙකක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයක පැවති කල් ඉකුත් වූ සහ තත්ත්වයෙන් බාල ඖෂධ ඒකක 378,974 ක් අපහරණය නොකර ඖෂධ ගබඩාව තුළ රඳවාගෙන තිබුණු අතර, එක් මූලික රෝහලක වර්ෂ 01 ත් 10 ත් අතර, කාලයක් කල්ඉකුත් වී තිබූ වර්ග 34 කට අයත් රසායනික ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 20.67 ක් අපහරණය කර නොතිබුණි.

## 6.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාවේ වාර්ෂික පුහුණු සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුල පුහුණු වැඩමුළු 100 ක් පැවැත්විය යුතු වුවත්, සැලසුම් කළ වැඩමුළු 22 ක් හා වෙනත් වැඩමුළු 43 ක් වශයෙන් වැඩමුළු 65 ක් පමණක් පවත්වා තිබුණි. නිලධාරීන් 5,440 ක් පුහුණු කිරීම සඳහා සැලසුම් කර තිබුණද, පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව 1,666 ක් විය. එමෙන්ම, වැඩමුළු පැවැත්වීමේ කාල වකවානු, සැලැස්ම පිළියෙල කිරීමේදී හඳුනාගෙන නොතිබුණි.

(ආ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසැල්වලට බෙදාහැරීම සඳහා රු.9,418,041 ක් වැයකර තූර්යවාදන කට්ටල මිල දී ගෙන තිබුණි. ඉන් එකතුව රු.1,592,640 ක් වූ ඉයුපෝනියම් 36 ක් මිල දී ගැනීම සඳහා 2016 දෙසැම්බර් ගිවිසුම් අත්සන් කර තිබුණ ද 2017 දෙසැම්බර් වනවිටත් එම භාණ්ඩ සපයා නොතිබුණි. 2016 දෙසැම්බර් ලැබී තිබුණු රු.7,825,401 ක ඉතිරි භාණ්ඩ තොගය 2018 ජනවාරි වන විටත් පාසැල් වෙත බෙදා හැර නොතිබුණු අතර, භාණ්ඩවල වගකීම් කාලය වර්ෂ 02 ක් වූ බැවින් ඒවා භාවිතා කිරීමටත් පෙර එක් වර්ෂයක් ගබඩාව තුළ දී ම අවසාන වී තිබුණි. ඊට අමතරව මෙම භාණ්ඩවල තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දීමට තාක්ෂණික ඇගයීම් කමිටුව මාස 12ක් ගතකර තිබුණ ද, ඊට හේතු විමසා නොතිබුණි.

(ඇ) සිසුන් අඩුවීම හෝ ස්වභාවික විපත් මත 1992 – 2018 කාලපරිච්ඡේදය තුළ සබරගමුව පළාතේ පාසැල් 130 ක් වසා තිබුණි. ඉන් පාසැල් 57 ක් ප්‍රාදේශීය ලේකම්කාර්යාල වෙත පවරාදී නොතිබුණු අතර පාසැල් 05 ක් වෙනත් කටයුතු සඳහා මුදාහැර තිබුණි. පාසැල් 17 ක ලීබඩු හා උපකරණ කිසිඳු ආයතනයකට පවරාදී නොතිබුණු අතර, පාසැල් 42 ක භූමිය හෝ ගොඩනැගිලි කිසිඳු භාවිතයකට නොගෙන නිෂ්කාර්යව පවතින කාලපරිච්ඡේදය වර්ෂ 02 -18 අතර කාල පරාසයක විය.

(ඈ) කෑගල්ල අධ්‍යාපන කලාපය තුළ පිහිටි ගුරු නිවාස 52 කින් 14 ක පමණක් නිලධාරින් පදිංචි වී සිටින අතර නිවාස 11 ක් එම පාසැල් වල වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි. නිවාස 03 ක් කඩා ඉවත් කිරීමට නියමිතව පැවැති අතර නිවාස 04 ක් අළුත්වැඩියා කරමින් පැවතුණි. එමෙන් ම නිවාස 20 ක් වර්ෂ 02 සිට 20 දක්වා පරාසයක සිට ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි .

(ඉ) 2014 අයවැය යෝජනා අනුව සංවර්ධන කටයුතු අධීක්ෂණය සඳහා පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට සහනදායි පදනම මත යතුරුපැදි ලබාදීමේ වැඩසටහනෙහි පළමු අදියර යටතේ යතුරු පැදි ලබා ගැනීම සඳහා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා රු.50,000 ක ණය මුදල් ලබාගෙන තිබුණු පළාත් පාලන නියෝජිතයින් 63 දෙනෙකු ණය මුදල් ගෙවීම පැහැර හැර තිබූ අතර, 2018 ජනවාරි 31 දින වනවිට හිඟ ශේෂය රු.873,951 ක් විය. ඊට අමතරව රු.50,000 ක සහනදායි මුදල එකවර ගෙවීමේ පදනම මත යතුරු පැදි ලබාගෙන තිබූ මහජන නියෝජිතයින් 37 දෙනෙකුගෙන් එකතුව රු.1,850,000 ක් අයකර ගැනීමට 2018 පෙබරවාරි වනවිටත් අපොහොසත් වී තිබුණි.

(ඊ) වරකාපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශය තුල 2017 සැප්තැම්බර් 30 දින වනවිට විධිමත් වැසිකිලි පහසුකම් නොමැති පවුල් 171 ක් හා කිසිඳු වැසිකිළියක් නොමැති පවුල් 435 ක් සිටියද ඔවුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සපයා දීමට කටයුතු කර නොතිබුණි.

(උ) පළාත් ඉඩම් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේදී රු. 22,432,350 ක් වැයකර හියුම් පයිප්ප 5,715 ක් මිලදී ගෙන තිබුණ අතර, එයින් රු.709,250 ක් වූ හියුම් පයිප්ප 225 ක් ගොවි සංවිධාන වෙත බෙදාහැරීමකින් තොරව ගොවිජන සේවා මධ්‍යස්ථාන වල රඳවාගෙන තිබුණි. එමෙන් ම ගොවි සංවිධාන වෙත බෙදාහැර තිබූ රු.321,250 ක් වූ හියුම් පයිප්ප 66 ක් භාවිතයට නොගෙන නිවෙස් වල රඳවාගෙන තිබුණ අතර, රු. 43,430 ක් වූ හියුම් පයිප්ප 07 ක් ගොවි සංවිධාන වෙත ලැබී නොතිබුණි.

(ඌ) විදුලිජනක යන්ත්‍ර මිල දී ගැනීමට පෙර හෝ ඊට සමගාමීව විදුලිජනක යන්ත්‍ර ස්ථාන ගත කිරීමට සුදුසු ස්ථාන හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි සැලසුම් හා ඇස්තමේන්තු ආදිය පිළියෙල නොකිරීම නිසා රු.8,400,000 ක පිරිවැයක් දරා කරවනැල්ල මූලික රෝහල වෙත ලබා දෙන ලද විදුලි ජනක යන්ත්‍රය වර්ෂ 01 මාස 06 ක කාල පරාසයක් දක්වා නිශ්ක්‍රීයව පැවතුණි.

**6.7 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම**

---------------------------------------------------

පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබූ පළාත් මාර්ග සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මොරතොට කෙටේතැන්න මාර්ගයේ කිලෝමීටර් 4.7 ක් කාපට් අතුරා සංවර්ධනය කිරීම සඳහා රු. 115,057,000 ක වටිනාකමකට 2016 දෙසැම්බර් 07 දින ගිවිසුමකට එළඹ තිබූ අතර, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම මාස 02 කින් ප්‍රමාද වී තිබුණි. ගිවිසුම අනුව 2017 සැප්තැම්බර් 19 දින වැඩ නිමවා භාරදිය යුතු වූ මෙම කර්මාන්තයේ සියයට 30 ක පමණ ඉදිකිරීමේ ප්‍රගතියකින් පසු 2017 නොවැම්බර් ඉදිකිරීම් අතර මඟ නවතා දමා තිබුණු අතර, 2018 ජනවාරි වනවිටත් නැවත ආරම්භ කර නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 06 ක් සඳහා ගෙවිය යුතු වටිනාකම් ඉක්මවා එකතුව රු. 5,073,839 ක් ගෙවා තිබුණි.

(ඇ) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද ගෙවීම් අවසන් කර තිබූ ව්‍යාපෘති 20 කට අදාල වටිනාකම රු. 300,000 ක් වූ නාම පුවරු 20 ක් සවි කර නොතිබුණි.

(ඈ) 2017 මැයි 12 දින වැඩ අවසන් කරන ලද ගම මැද මාර්ගය සිට කිවුල ආර හන්දිය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් ඝන මීටර් 101.70 ක් වෙනුවෙන් රු. 1,508,292 ක් ගෙවා තිබූ නමුත් භෞතික පරීක්ෂාවේදී මාර්ගය ආරම්භක ස්ථානයේ සිට මීටර් 200 ඇතුලත මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ස්ථරය සම්පූර්ණයෙන් ගැලවී ගොස් යොදන ලද අඟල් ¾ ගල් මතුවී තිබූ බව භෞතික පරීක්ෂාවේ දි නිරීක්ෂණය විය.

(ඉ) ඉහළ වැලිකඩ සිට වැවේලන්ද මාර්ගයෙහි කොන්ක්‍රීට් ඇතිරීමට පෙර මාර්ගයෙහි පාදම සකස් කිරීම වෙනුවෙන් වැඩ විෂයයන් දෙකක් යටතේ රු. 234,179 ක් ගෙවා තිබූ නමුත් පාදම නිසි ප්‍රමිතියෙන් යුක්තව ඉදි නොකිරීම නිසා දිග මීටර් 215.2 ක් වූ සමස්ථ මාර්ගයෙහිම කොන්ක්‍රීට් ස්ථරය දික් අතට පිපිරී තිබුණි. එමෙන්ම සම්පූර්ණ මාර්ග තලයෙහි මතුපිට කොන්ක්‍රීට් ස්ථරය ගැලවී ගොස් කොන්ක්‍රීට් සඳහා යොදන ලද අඟල් ¾ ගල් මතුවී තිබුණි.

(ඊ) 2017 ජූලි 20 දින වැඩ අවසන් කරන ලද දිග මීටර් 212 ක් වූ උඩවලව මුදුන්මංකඩ මාර්ගයේ එක් වැඩ විෂයයක් යටතේ කොන්ක්‍රීට් ඝන මීටර් 95.40 ඇතිරීම වෙනුවෙන් රු. 1,414,858 ක් ගෙවා තිබුණු නමුත් සමස්ථ මාර්ග තලයෙහිම මතුපිට කොන්ක්‍රීට් ස්ථරය සම්පූර්ණයෙන් ගැලවී ගොස් කොන්ක්‍රීට් සඳහා යොදන ලද අඟල් ¾ ගල් මතු වී තිබුණි.

(උ) 2016 සැප්තැම්බර් 12 දින වැඩ අවසන් කරන ලද තුංකම චන්ද්‍රිකාරාම මාර්ගයේ එක් වැඩ විෂයයක් යටතේ කොන්ක්‍රීට් ඝන මීටර් 120.15 ක් වෙනුවෙන් රු. 1,677,714 ක් ගෙවා තිබූ නමුත් පන්සල දෙස සිට මාර්ගය ආරම්භක දෙසට මීටර් 100 ක් ඇතුලත මාර්ගයේ ස්ථාන 03 ක දිග මීටර් 5 ක් පමණ වූ හරස් පැලුම් ඉරි පැවති අතර වැඩ අවසන් කර මාස 13 ක් ඉක්මවීමටත් පෙර මාර්ගය මතුපිට කොන්ක්‍රීට් ස්ථරය ගැලවී ගොස් යොදන ලද අඟල් ¾'' ගල් මතුවී තිබුණි. තවද, යොදන ලද කොන්ක්‍රීට් මිශ්‍රණයේ හනිකොම්බ් ලක්ෂණ මතුවී තිබුණි.

(ඌ) කහවත්ත - කට්ටන්ගේ හරහා දෙල්ගස් හන්දිය දක්වා වූ මාර්ගයේ කාපට් නොකරන ලද ස්ථාන තුනක මාර්ගය ඉතා දැඩි ලෙස අබලන්ව පැවතීම සහ මාර්ග තලය මත විශාල වශයෙන් ජලය රැඳී තිබීමෙන් වාහන ගමනා ගමනය ඉතා අනතුරුදායක මට්ටමක පැවතීම නිසා 2017 ඔක්තෝබර් දිස්ත්‍රික් රථ වාහන කමිටුවේ තීරණය අනුව මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා රු. 13,446,000 ක ඇස්තමේන්තුවක් 2017 දෙසැම්බර් මස ඉදිරිපත් කර තිබූ නමුත් 2018 ජනවාරි වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ) ගනේගම දෙනවක මාර්ගය වර්ග මීටර් 752.19 ක් කාපට් දමා සංවර්ධනය කිරීම සඳහා වූ රු.3,181,321 ක වටිනාකම තුළ ව්‍යාපෘතියේ තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා රු. 20,000 ක් වෙන්කර තිබුණද තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව රු.2,965,592 ක් වූ කළ වැඩ විධායක ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර තිබුණි.

(ඒ) මහවලතැන්න වලව්ව මාර්ගය අළුත් වැඩියා කිරීමෙන් පසු මාර්ග පිවිසුමේ සිට කි.මී.2.2 ස්ථානයේ සිට කි.මී 2.3 දක්වා වූ මීටර් 100 ක ප්‍රමාණයක් මාර්ගය සම්පූර්ණයෙන් ඉරිතලා තිබුණද, රු. 190,817 ක් වූ රඳවා ගැනීමේ මුදල් භාවිත කර එය පිළිසකර කිරීමට 2017 දෙසැම්බර් වනවිටත් කටයුතු කර නොතිබුණි.

## 6.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සබරගමුව වාණිජ හා කර්මාන්ත මණ්ඩලය මගින් වාර්ෂිකව පවත්වනු ලබන සබරගමුව පළාත් විශිෂ්ඨතම ව්‍යවසායකයා සඳහා වූ 2017 වර්ෂයේ සම්මාන ප්‍රදාන උත්සවය සඳහා රු.1,000,000 ක මූල්‍යමය අනුග්‍රාහකත්වයක් පළාත් කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. එම මුදල වාණිජ මණ්ඩලය විසින් එවන ලද ඉල්ලීම් ලිපිය හා විධිමත් අනුමැතියක් රහිත දළ වියදම් ඇස්තමේන්තුවක් මත අවසාන ගෙවීමක් ලෙස ලබා දී තිබුණි. මෙවැනි වැඩසටහනක් සඳහා 2016 වර්ෂයේ දී රු.600,000 ක මූල්‍ය අනුග්‍රාහකත්වයක් ලබා දී තිබුණි.

(ආ) පළාත් අමාත්‍යවරුන් වෙත පළාත් සභාව මගින් සපයා දී තිබුණු සියලු වත්කම් පළාත් සභාව විසිරවීමෙන් පසු ආපසු පළාත් සභාව වෙත භාර දිය යුතු වුවත්, ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු පළාත් සභා නියෝජිතයන් වෙත සපයා තිබුණු එකතුව රු.7,160,280 ක් වටිනා උපකරණ 58 ක් 2017 නොවැම්බර් වනවිටත් ආපසු භාර දී නොතිබුණි.

(ඇ) දිරි දීමනා අරමුදලේ ගනුදෙනු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දිරි දීමනා අරමුදල ආරම්භ කළ 1994 වර්ෂයේ සිට වර්ෂ 22 ක් ගිණුම් පිළියෙල කර නොතිබුණු අතර 2017 වර්ෂය වෙනුවෙන් අවසාන ගිණුමක් පිළියෙල කර තිබුණි. මේ නිසා ඉකුත් වර්ෂ 22 ක සිදු වූ ගනුදෙනු හා ඒවා ගිණුම්ගත කිරීම පිළිබඳව සහ 2017 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ ශේෂ පත්‍රයේ ආරම්භක ශේෂවල නිවැරදිතාව මෙන්ම අඛණ්ඩව සමාලෝචිත වර්ෂය දක්වා ඉදිරියට ගෙනැවිත් තිබුණු සියලු වර්ෂවල ආරම්භක ශේෂවල නිවැරදිතාව පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගත නොහැකි විය.

(ii) 2016 පෙබරවාරි 25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය 2016 - චක්‍රලේඛයේ 06 වගන්තියට පටහැනිව රු.3,677,966 ක දිරි දීමනා මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 6.9 අවිධිමත් ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ හඳුනාගත් ව්‍යාපෘති 03 ක් සඳහා එකතුව රු. 5,893,620 ක් වෙන්කර දී තිබූ නමුත් ගිවිසුම්ගත පරිදි එම කර්මාන්තයන් අදාළ ස්ථානයන්හි ක්‍රියාත්මක කර නොතිබුණි. එම කර්මාන්ත වෙනුවෙන් ලද ප්‍රතිපාදන, වෙනත් ස්ථාන තුනක කර්මාන්ත සංවර්ධනය සඳහා යොදාගත් බව කාර්මික නිලධාරී විසින් ප්‍රකාශ කළද එම සංශෝධන සම්බන්ධයෙන් කිසිඳු ලේඛනගත සාක්ෂියක් ගොනුගත කර නොතිබුණි.

(ආ) මධ්‍යම රජයට අයත් දෙපාර්තමේන්තු වලින් යෝජනා කරන ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශන ගාස්තු ලෙස සියයට 4.5 ක් ලබාගැනීමට හා එම කර්මාන්ත සඳහා සෘජුවම දායක වන ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දායකත්වය ආවරණය වන පරිදි ගෙවීම් කිරීමට ප්‍රධාන ලේකම් විසින් අනුමැතිය ලබාදී තිබුණද ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රධාන කරුණු දැක්වීම් එම ලිපියේ අන්තර්ගත වී නොමැති වීම හේතුවෙන් ගෙවන ලද උපදේශන දීමනා පරීක්ෂා කිරීමට අදාලව විගණන විෂය පථය සීමා විය.

(ඈ) හිටපු ප්‍රධාන අමාත්‍යවරයා විසින් 2017 ජනවාරි සිට 2017 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාලසීමාව තුල සිදු කරන ලද විදේශ සංචාර 04 ක දී තිළිණ රැගෙන යාම වෙනුවෙන් එකතුව රු. 1,238,545 ක් පළාත් සභා අරමුදලින් වැය කර තිබුණි.

(ඇ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර තිබූ ඉරාන ජාතික කබඩි කණ්ඩායමේ සබරගමුව පළාත් සංචාරය සඳහා ආදායකයාගේ නමට සෘජුව චෙක්පත් නිකුත් කිරීමේ හැකියාව පැවති එකතුව රු. 1,947,860 ක වියදම් සඳහා අත්තිකාරම් ලෙස මුදල් නිකුත් කර තිබුණි. එම අත්තිකාරම් මඟින් ක්‍රීඩකයින් 31 දෙනෙකුට දින 07 ක් සඳහා ආහාරපාන හා නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවීමකින් තොරව තෝරාගත් පෞද්ගලික ආයතනයක් වෙත රු. 1,295,200 ක් ගෙවා තිබුණු අතර, සංචාරය සඳහා අදාළ කරගත නොහැකි වියදම් ලෙස එකතුව රු.264,700 ක් දරා තිබුණි.

(ඉ) පළාත් මාර්ග අමාත්‍යවරයාගේ උත්සව හා ජනහමු වෙනුවෙන් අවස්ථා 10 කදී දරන ලද සංග්‍රහ වියදම් හා හෝටල් ගාස්තු සඳහා එකතුව රු. 1,684,000 ක් අමාත්‍යවරයාගේ නමින් ලියන ලද චෙක්පත් මඟින් ප්‍රතිපූරණය කර තිබුණි.

## 6.10 වත්කම් කළමනාකරණය

-----------------------------

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පළාත් සභාවට අයත් විවිධ ආයතනයන්හි වටිනාකම රු.32,285,778 ක් වූ යන්ත්‍රෝපකරණ 14 ක් වර්ෂ 06 ක සිට ද වටිනාකම හඳුනා නොගත් යන්ත්‍රපෝකරණ 11 ක් මාස 7 සිට වර්ෂ 06 දක්වා කාල පරාසයක සිට ද, වටිනාකම රු.2,931,183 ක් වූ ගොඩනැගිල්ලක් වර්ෂ 02 සිට ද, වටිනාකම හඳුනාගත නොහැකි වාහනයක් වර්ෂ 02 ක කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ**

-----------------------------

රත්නපුර හා මාවනැල්ල අධ්‍යාපන කලාප තුළ පිහිටි පාසැල් 299 කින් පාසැල් 178 ක, අවසන් වරට භාණ්ඩ සමීක්ෂණය සිදුකළ වර්ෂය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. ඉතිරි කලාප 05 ට අයත් පාසැල් 689 කින් පාසැල් 340 ක 2016 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. එය සියයට 50 ක ප්‍රමාණාත්මක ප්‍රතිශතයක් විය. එමෙන්ම, අධ්‍යාපන කලාප 02 ක වර්ෂ 05 කට වැඩි කාලයක් භාණ්ඩ සමීක්ෂණයක් සිදු නොකළ පාසල් ගණන 70 ක් විය.

**(ඇ) බාහිර පාර්ශවයන් අනවසරයෙන් අත්පත් කරගෙන ඇති වත්කම්**

-----------------------------------------------------------------------

පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් රජයේ නිවාස පිහිටා ඇති භූමියෙන් කොටසක් සහ කහවත්ත මූලික රෝහලට අයත් ඉඩමෙන් කොටසක් බාහිර පාර්ශව විසින් අත්පත් කරගෙන තිබුණද, එම දේපල නිරවුල් කර ගෙන නොතිබුණි.

## 6.11 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ඉදිකර තිබූ කොළඹගෙආර විද්‍යාලීය ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා පිටතින් පස් ගෙනවිත් පිරවීම, තුනී කිරීම සහ තැලීම වෙනුවෙන් එකතුව රු. 1,536,234 ක් ගෙවා තිබූ නමුත් එම වැඩ විෂයයන් ඉටුකර නොතිබුණි. යථෝක්ත සංවර්ධනය හේතුවෙන් ක්‍රීඩාපිටිය පැවති තත්ත්වයටත් වඩා පිරිහී තිබුණු අතර වර්ෂා ජලය පිරීම සහ පස් සෝදා ගෙන යාම

හේතුවෙන් ක්‍රීඩාපිටිය භාවිතා කිරීමට අපහසු වී තිබුණි. ඒ හේතුවෙන් දරන ලද රු. 1,969,287 ක වැය නිෂ්ඵල වී තිබුණි.

(ආ) ආණ්ඩුකාරවර කාර්යාලයට අයත් පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබූ වාහනයක් 2016 මැයි 08 දින අනතුරට පත් වී තිබූ අතර, සිදු වූ හානිය යථාතත්වයට පත් කිරීමට දරන ලද රු.620,000 ක් ප්‍රතිපූර්ණය කිරීම රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කර තිබුණ ද එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.12 දෘශ්‍ය අක්‍රමිකතා**

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබූ තිඹොල්කැටිය විද්‍යාලීය ක්‍රීඩාපිටිය සංවර්ධනය I අදියර ව්‍යාපෘතිය වෙනුවෙන් ගොවි සංවිධානයක් වෙත රු. 1,986,576 ක් ගෙවීම් කර තිබුණද, එම අදියර යටතේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කර නොතිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශය මගින් විවිධ ආගමික උත්සව සඳහා විහාරස්ථාන වෙත ලබා දී තිබුණු රු.8,338,450 ක් වූ පරිත්‍යාග වලින් සියයට 20 ක නියැදියක්, එනම් රු. 1,700,000 ක ගෙවීම් පරීක්ෂාවේ දී රු. 1,335,000 ක් අදාළ විහාරස්ථාන වෙත ලැබී නොතිබුණි. එය තෝරාගත් නියැදියෙන් සියයට 78 ක ප්‍රමාණාත්මක ප්‍රතිශතයක් විය.

(ඇ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක වහලය අලුත්වැඩියා කිරීම හා ක්‍රීඩා උපකරණ ලබාදීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශය මගින් ලබා දී තිබූ රු.150,000 ක චෙක්පතක් අමාත්‍යාංශයේ කාර්යාල කාර්ය සහායක විසින් ව්‍යාජ ලේඛන පිළියෙල කර ලබාගෙන තිබුණි.

**6.13 නිෂ්ඵල වියදම්**

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සූර්ය බල ශක්තිය මගින් විදුලිය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියක් සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ හා කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නිලධාරීන් පිරිසක් චීනයේ සංචාරයක නියැලී තිබුණි. එහෙත් ඉන් අපේක්ෂා කල තාක්ෂණික හැකියාව ලබා ගැනීම, පුහුණුවීම් ලබාදීම, විදේශීය ඍජු ආනයන සිදු කිරීම යනාදී කරුණු කිසිවක් ඉටුකර නොතිබුණු අතර, ඊට පසුව කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වූ ආයතන 05 ක සූර්ය බල ශක්ති අවශ්‍යතාවය දේශීය ආයතනයකින් සම්පූර්ණ කර ගැනීමට රු.5,833,000 ක් වැය කර තිබුණි. ඒ අනුව, විදේශ සංචාරය වෙනුවෙන් වැයකල රු. 6,891,189 ක් නිෂ්ඵල වියදමක් විය.

(ආ) සබරගමුව පළාත් සභා සංකීර්ණයේ 2017 වර්ෂය සඳහා ආරක්ෂක සේවා වෙනුවෙන් කළ ලංසු කැඳවීම සාධාරණ හේතුවක් රහිතව අවලංගු කිරීම නිසා පුවත්පත් දැන්වීම් සඳහා වැය කළ රු.115,575 ක් නිෂ්ඵල වී තිබුණි. 2016 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සැපයූ ආයතනය විසින් 2017 වර්ෂය සඳහා ද ලංසු ඉදිරිපත් කර තිබුණි. එහෙත් ඊට වඩා අඩු මිල ගණන් ඉදිරිපත් කළ ආයතන 05 ක් පැවතිය ද, ඉහත අවලංගු කිරීම නිසා 2018 මාර්තු වනවිටත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් එම ආයතනයේම සේවය ලබා ගනිමින් පැවතිණි.

**6.14 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සබරගමුව පළාත තුළ තෝරාගත් ස්ථාන 200 ක් සඳහා දින 90 ක කාල සීමාවක් තුළ මගී ආවරණ සපයා සවි කිරීම වෙනුවෙන් රු.56,700,000 ක වටිනාකමකට පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 30 දින පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ප්‍රසම්පාදන ඇගයීම හා පිරිනැමීම මෙන්ම, ඉදිකිරීම් වලදී සිදුවී තිබූ දෝෂ හේතුවෙන් පළාත් අරමුදලට එකතුව රු.11,015,700 ක පාඩුවක් සිදු වී තිබූ අතර 2018 ජනවාරි 31 දින වනවිටත් මගී ආවරණ 15 ක වැඩ අවසන් කර නොතිබුණි. 2016 ජූනි 30 දිනෙන් පසු විධිමත් පරිදි කාලය දීර්ඝ කිරීම් ලබා දී නොතිබුණු අතර, 2018 ජනවාරි 31 දින වනවිට දින 580 ක ප්‍රමාද කාලය සඳහා අයකළ යුතු ප්‍රමාද ගාස්තු රු.2,349,900 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ර/ඇඹි/නින්දගම්පැලැස්ස විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා රු. 1,970,273 ක් වැය කර තිබුණ ද, පස් තැලීම අවිධිමත්ව සිදුකිරීම නිසා ක්‍රීඩා පිටියේ පස් සේදී ගොස් බාදනය වී තිබුණු අතර ක්‍රීඩා පිටිය පුරා ඉරි තැලීම් විය. එමෙන්ම, එම ඉදිකිරීම් වෙනුවෙන් රු. 353,676 ක වැඩිපුර ගෙවීමක් ද සිදුකර තිබුණි .

(ඇ) බලංගොඩ අධ්‍යාපන කලාපයේ පාසල් 13 ක 2015 වර්ෂයේ ආරම්භ කළ විද්‍යාගාර ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් 2017 දෙසැම්බර් වනවිට රු. 3,710,676 ක් වැයකර පළමු අදියරේ ඉදිකිරීම් අවසන් කළ විද්‍යාගාර 02 ක් දෙවන අදියරේ වැඩ ක්‍රියාත්මක නොවීම මත 2018 පෙබරවාරි දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. එක් විද්‍යාගාර ගොඩනැගිල්ලක් හය මසක් තුළ ඉදි කිරීමට 2015 නොවැම්බර් මස ගිවිසුම්ගතව තිබුණ ද රු. 1,179,643 ක් වූ වැඩ විෂයයන් 39 ක් 2018 පෙබරවාරි දක්වාම අවසන් කර නොතිබුණි.

(ඈ) ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය මඟින් රත්නපුර ර/දැල මහා විද්‍යාලයේ 2016 වර්ෂයේදී ඉදි කළ රු.797,590 ක් වූ වැසිකිළි පද්ධතිය, ජල පහසුකම් නොමැති වීම හේතුවෙන් භාවිතා නොකර අතහැර දමා තිබුණි.

(ඉ) දෙහිඕවිට මාලිබොඩ දේවානන්ද විදුහලේ අළුත්වැඩියාව සඳහා රු. 206,400 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර රු. 729,791 ක් ගෙවීම් සඳහා කිසිඳු ලිඛිත සාක්ෂියක් නොතිබුණි. එමෙන්ම, පාසැල් සංවර්ධන සමිති ගිණුමෙන් රු. 136,344 ක් අනුමැතියකින් තොරව දරා තිබුණි.

(ඊ) ඇඹිලිපිටිය ප්‍රාථමික විද්‍යාලීය ක්‍රීඩාපිටියෙහි පැති බැම්ම සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා අනුමත කරන ලද අවසන් බිල්පතෙහි වැඩ වටිනාකම හා 2017 ඔක්තෝබර් 04 දින වනවිට සත්‍ය වශයෙන් නිමකරන ලද වැඩ සඳහා ගෙවිය යුතු වටිනාකම සලකා බැලීමේදී රු. 915,431 ක් වූ ඉටු නොකරන ලද වැඩ සඳහා ගෙවීම් අනුමත කර 2017 සැප්තැම්බර් 04 දින පළාත් මාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. කර්මාන්තයේ වැඩ විෂයය අංක 02 යටතේ බැම්මෙහි අත්තිවාරම සඳහා වැඩ වටිනාකම රු.98,773 ක් වූ කොන්ක්‍රීට් ඝනමීටර් 6.66 ක් යොදා නොතිබුණි. නිසි ප්‍රමිතියෙන් අත්තිවාරම ඉදි නොකිරීම හේතුවෙන් මැටි පස් සහිත කුඹුරු ප්‍රදේශයක ඉදිකරනු ලබන ගල් බැම්මෙහි පැවැත්ම ගැටළු සහගත විය හැකි බව නිරීක්ෂණය විය.

(උ) සභා ලේකම් කාර්යාලයට අයත් මන්ත්‍රී සංචාරක බංගලාවේ භූමි අලංකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 190,571 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ආයතනය විසින් විධිමත් කොන්ත්‍රාත්

ගිවිසුමකට නොඑළඹීම නිසා එකඟ වූ වැඩ විෂයයන් ඉටු නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

**6.15 ප්‍රමාද වූ ව්‍යාපෘති**

-------------------

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 03 ක් විසින් ක්‍රියාත්මක කර තිබූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 76 ක් විවිධ හේතූන් නිසා ප්‍රමාදවී තිබූ අතර, එක් දෙපාර්තමේන්තුවක ඉදිකිරීම් කොන්ත්‍රාත් 20 ක් ආරම්භ නොකර සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

**6.16 ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති**

-------------------------------------------

ගොඩකවෙල බුළුවාන ග්‍රාමයේ මැටි කර්මාන්තකරුවන් 14 දෙනෙකු සඳහා වැඩමඩු සැකසීමට රු. 974,120 ක ආධාර ලබා දී තිබුණි. ඇති කරගත් ලිඛිත එකඟතාව අනුව වැඩමඩු කිසිවක ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර, මුළු පිරිවැයෙන් සියයට 50 ක ප්‍රතිලාභි දායකත්වයක් දැරීමට ආධාරලාභීන්ට සිදුවීම ව්‍යාපෘතියෙහි අසාර්ථකත්වයට හේතු වී තිබුණි. එම ගම්මානයේ පවතින ස්වභාවික මැටි නිධිය වෙත මාර්ග පහසුකම් නොමැතිවීම කර්මාන්තකරුවන්ට පවතින ප්‍රධාන අභියෝගයක් වුවද, ඊට විසඳුම් ලැබී නොතිබුණි.

**6.17 ප්‍රසම්පාදනය**

--------------

**සැපයීම් හා සේවා**

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආණ්ඩුකාරවර කාර්යාලයට අයත් වාහන 04 ක් සඳහා ටයර් මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 06 කදී එකතුව රු. 955,608 ක් වැයකර තිබුණි. ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු වලදී සිදුව තිබූ දෝෂ හා අක්‍රමිකතා හේතුවෙන් පළාත් අරමුදලට රු. 223,832 ක පාඩුවක් සිදුව තිබුණි.

(ආ) 20 වන ජාත්‍යන්තර සිසු තත්ත්වකව සම්මේලනය සඳහා පැමිණි විදේශීය නියෝජිතයන් වෙත ලබා දීම සඳහා තිළිණ මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් වෙත එකතුව රු. 269,200 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද සබරගමුව පළාත් සංචාරක ප්‍රවර්ධන ඩී.වී.ඩී. පටයක් නිර්මාණය වෙනුවෙන් ලැබී තිබූ රු. 877,478 ක අවම ලංසු වටිනාකම ඇගයීම් කමිටුව විසින් සාධාරණ පදනමකින් තොරව ප්‍රතික්ෂේප කරමින් රු. 984,000 ක ලංසුව සඳහා 2016 ඔක්තෝබර් 27 දින අනුමැතිය ලබා දී තිබුණි. ඒ හේතුවෙන් පළාත් අරමුදලට රු. 106,522 ක පාඩුවක් සිදු වී තිබූ අතර 2018 ජනවාරි 18 දින වනවිටත් අදාළ නිර්මාණ කටයුතු අවසන්ව නොතිබුණි.

**6.18 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**6.18.1 කාර්යය මණ්ඩල පරිපාලනය**

\- -----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග නොසලකා 2017 ජනවාරි 01 දින සිට අප්‍රේල් 05 දින දක්වා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් තනතුරෙහි රැඳී සිටි නිලධාරියෙකු

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2017 අප්‍රේල් 06 දිනැති ලිපිය මඟින් පළාත් රාජ්‍ය සේවයෙන් නිදහස් කර තිබුණි. එහෙත් එකී නියෝගය නොසලකා පළාත් සභාව තුල තවදුරටත් රැඳීසිටි එම නිලධාරියා විසින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් 2018 ජුනි 09 දින ධාවනය කිරීමේ දි අනතුරට පත්ව තිබුණි. එහෙත් එම කරුණු සම්බන්ධයෙන් කිසිඳු විමර්ශනයක් සිදුකර නොතිබුණු අතර, ස්ථාන මාරු නියෝග නොසලකා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් තනතුරෙහි රැඳීසිටි කාලය වෙනුවෙන් වැටුපට අමතරව රාජකාරි ඉටු කිරීමේ දීමනා රු. 28,260 ක් හා 2017 අප්‍රේල් සිට ජූලි දක්වා විශ්‍රාම වැටුප් අරමුදලේ අධ්‍යක්ෂ දීමනා ලෙස එකතුව රු. 44,312 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) 2013 ජනවාරි 01 දින සිට බල පැවැත්තෙන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ කාර්ය මණ්ඩල වාර්තාවේ පොදු උපදෙස්වලට පටහැනිව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරිණියක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ තනතුරක් වූ සමුපකාර කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර 2013 ජනවාරි සිට 2017 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාල වැඩ බැලීමේ දීමනා ලෙස රු.403,364 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) උඩුගොඩ සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ 2017 ජූලි 28 දින වනවිට විවිධ සේවා කාණ්ඩ යටතේ නිලධාරීන් හා සේවකයන් 88 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණ ද විධිමත් ලෙස අනුමත වූ කාර්ය මණ්ඩලයක් නොවුණි.

**6.18.2 අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාතේ පාසල් වල ගුරු අවශ්‍යතාවයන් සලකා සකස් කර තිබූ යෝග්‍ය ගුරු සංඛ්‍යාව සමඟ සැසඳීමේදී ප්‍රධාන විෂයයන් සම්බන්ධයෙන් ගුරු ඌනතා සහ අතිරික්තතා පැවතුණි. විස්තර පහත දැක්වේ.

**6-11 ද්විතීක අංශය**

| විෂයය | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|
| ඉංග්‍රිසි | 161 | 79 |
| තාක්ෂණ විෂයය | 633 | 52 |
| විද්‍යාව | 171 | 65 |
| ගණිතය | 186 | 67 |
| වෙනත් විෂයයන් | 1433 | 334 |

**12-13 උසස් පෙළ අංශය**

| විෂයය | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|
| විද්‍යා හා අතිරේක විෂයයන් | 41 | 24 |
| වාණිජ විෂයයන් | 33 | 43 |
| කලා විෂයයන් | 37 | 163 |
| තාක්ෂණ විෂයයන් | 35 | 3 |

ඉහත ඉදිරිපත් කරන ලද විස්තර 2016 වර්ෂයේ තොරතුරු පදනම් කරගෙන සකස් කළ අතර, සමාලෝචිත වර්ෂයේ ඌණතා හා අතිරික්තතා පිළිබඳ වාර්තාවක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**6.18.3 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා**

---

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවය, විවිධ ආයතන මට්ටමින් පහත දැක්වේ.

| | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | ඇඹිලිපිටිය රෝහල |
|---|---|---|---|---|---|---|---|
| | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | ඌනතාවය |
| වෛද්‍ය | - | 02 | - | 68 | - | 30 | 34 |
| දන්ත වෛද්‍ය | - | - | - | 03 | - | 14 | 02 |
| හෙද | - | 01 | 99 | - | - | 33 | 71 |
| හෙද වාට්ටු සොයුරිය / | - | - | - | 14 | - | 06 | 11 |
| වෛද්‍ය රසායනාගාර ශිල්පී | - | - | - | 09 | - | 20 | 04 |
| විකිරණ ශිල්පී | - | - | - | 04 | 02 | - | 03 |
| භෞත චිකිත්සක | - | - | - | 03 | - | 04 | 01 |
| ඊසීජී වාර්තාකරු | - | - | - | 05 | - | - | 02 |
| ඖෂධ සංයෝජක | - | - | 09 | - | - | 47 | 01 |
| ඖෂධවේදී | - | - | - | 11 | - | 18 | 04 |
| වෘත්තීය චිකිත්සක | - | - | - | 02 | - | - | 01 |
| පාසල් දන්ත චිකිත්සක | - | - | - | 04 | - | - | - |
| කීට විද්‍යාඥ සහායක | - | - | - | 08 | - | 01 | 01 |
| පවුල් සෞඛ්‍ය සේවිකා | - | - | - | 125 | - | 126 | 10 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | 01 | - | - | 06 | - | 21 | - |
| මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි | 01 | - | 09 | - | - | 14 | - |
| උපස්ථායක | - | - | - | 38 | - | - | 80 |
| විද්‍යාගාර පරීක්ෂක | - | - | - | 03 | - | - | - |
| සෞඛ්‍ය කාර්ය සහායක | - | 03 | 428 | - | 330 | - | 80 |
| රෝහල් කංකානම | - | - | - | 07 | - | - | 01 |
| අක්ෂි චිකිත්සක | - | - | - | 01 | - | 01 | - |
| එකතුව | 02 | 06 | 545 | 311 | 332 | 335 | 306 |

## 6.19 බැංකු සැසඳුම්

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාව යටතේ වූ විවිධ ආයතනවල නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු. 1,027,670 ක් වූ චෙක්පත් 57 ක්

සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 283.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ එකතුව රු.282,232 ක් වූ තැන්පතු 31 ක් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 02 කට අදාළ හඳුනානොගත් බැර කිරීම්වල එකතුව රු. 980,524 ක් විය.

## 07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂයේදී එක් අමාත්‍යාංශයක් හා එක් දෙපාර්තමේන්තුවක් විගණන හා කළමනාකරණ කමිටු 03 ක් පමණක් පවත්වා තිබුණි.

### 7.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

පළාත් ගිණුම් කාරක සභාවේ සාකච්ඡා කරන ලද 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වර්ෂ 08 ක විගණකාධිපති වාර්තාවල ඇතුළත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 06 කට අදාල විගණන ඡේද 25 ක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

## 08. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබීම |
| (ආ) | ආදායම් කළමනාකරණය | (i) | ඇස්තමේන්තු ගත හා තථ්‍ය ආදායම අතර විචලතා පැවතිම. |
| | | (ii) | හිඟ ආදායම් අයකර නොතිබීම |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් පැවතිම |
| | | (ii) | භාණ්ඩ සමීක්ෂණයේ සියලු කාර්යාල ආවරණය වන පරිදි සිදු කර නොතිබීම |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | | කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්තතා පැවතීම |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | ඉටු නොකළ වැඩ වෙනුවෙන් ගෙවීම් කර තිබීම |
| | | (ii) | ප්‍රමාද ගාස්තු අයකර නොතිබීම |
| (ඊ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | (i) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් පැවැතීම |
| | | (ii) | ආරම්භ නොකළ ව්‍යාපෘති පැවතීම |
| (උ) | පාසල් කළමනාකරණය | | පළාත තුළ ගුරු තුලනය දුර්වල මට්ටමක පැවතිම |